පුවතක ඇතුළත් තොරතුරු වල රහසා භාවය ආරක්ෂා කළ යුතු මූලාශ්‍ර අනාවරණය කිරීමේ අවසරය එම මූලාශ්‍රයන්ගෙන් නොලැබෙන්නේ නම් ඒ හෙළිදරව් නොකිරීමේ සදාචාරාත්මක වගකීමක් මාධ්‍යවේදීන් අත තිබේ.

පුවතක් වාර්තා කිරීමේදී හැකි සෑම විටකම එහි අන්තර්ගත කරුණු වලට පදනම් වූ මූලාශ්‍රයන් දක්වන ලෙස මාධ්‍ය ආචාර ධර්ම තුළ දැක්වේ. ඒ මූලාශ්‍ර සඳහන් කිරීම ඔස්සේ එම පුවතේ විශ්වසනීයත්වය ඉහළ යන බැවිනි. අනෙක් අතට, නිරන්තරයෙන්ම මූලාශ්‍ර සඳහන් නොකිරීම ඔස්සේ අසත්‍ය සහ නොමග යවන සුළු තොරතුරු වුවද ඉදිරිපත් වීමේ හැකියාවක් තිබීම නිසාම, හැකි සෑම අවස්ථාවකම පාහේ මූලාශ්‍ර සහිතව තොරතුරු ඉදිරිපත් කිරීම මාධ්‍ය ආචාර ධර්මානුකූලව අනිවාර්ය කරුණක් වනු ඇත.

මේ අනුව, "පාස්කු ප්‍රහාරයේ මහ මොළකරු ඊජිප්තු මුස්ලිම් සංවිධානයක්" යන සිරස්තලයෙන් යුතුව දිවයින පුවත්පතේ (01/11) දැක්වී ඇති පහත පුවතේ අඩංගු කරුණු සඳහා කිසිදු මූලාශ්‍රයක් දැක්වී නොමැත්තේ මන්දැයි අප විමසිය යුතු වේ. විශේෂයෙන්ම පාස්කු ප්‍රහාරය වැනි මහජන අවධානය යොමුවී ඇති, ජාතික ආරක්ෂාවටද අදාළ සිදුවීමක් සම්බන්ධයෙන් දැක්වෙන පුවත් වාර්තාවන්හි විශ්වසනීයත්වය ඉහළින්ම තිබිය යුතු නොවේද? ඒ සඳහා මෙම තොරතුරු ලබාගැනී ඇති මූලාශ්‍රයන් ඉදිරිපත් කිරීම සාධනීය වන්නට තිබුණා නොවේද? මේ සම්බන්ධයෙන් ඔබේ අදහස කුමක්ද?

මූලාශ්‍ර: ද ඇසෝසියේටඩ්ප්‍රෙස්, Anonymous Sources(අඥාත මූලාශ්‍ර),
ප්‍රවේශය: https://www.ap.org/about/news-values-and-principles/telling-the-story/anonymous-sources.

#MediaEthicsSL #lka #SinhalaPress #SundayDivaina